# 4 දුක් උසුලන සේවකයාණෝ

අප බලාපොරොත්තු වන්නේ දුක් උසුලන සේවකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළින් අපගේ ජීවිත සවිමත් කර ගැනීමයි. ඒ සඳහා ප්‍රවේශයක් ලෙස නොයෙකුත් දුක් විඳීම් මැදින් ගමන් කළ අය පිළිබඳවත් යෙසායාතුමන්ගේ විග්‍රහය පිළිබඳවත් ප්‍රායෝගික අභියෝග පිළිබඳවත් සලකා බැලීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

**ජෝබ් 1 පරිච්ඡේදය, ජෙරමියා 38: 1-13, යෙසායා 42: 1-4**

ගුරුතුමී : අද අපි ඇදහිල්ල නිසා දුක් වින්ද කිහිපදෙනකු අතරින් ජෝබ් හා ජෙරමියා ගැන සාකච්ඡා කරමු.

ශෙහාන් : අපි හරි ආසයි ජෝබ්ගේ කථාව දැනගන්න.

ගුරුතුමී : අපි දැන් ජෝබ් පළමුවෙනි පරිච්ඡේදය පෙරළා ගනිමු.

කියවා බලමු.

**ජෝබ් 1 පරිච්ඡේදය**

ගුරුතුමී : මේ බයිබල් කොටසින් පැහැදිලි වන්නේ දෙවියන් වහන්සේ ජෝබ්ගේ ඇදහිල්ල ශක්තිමත් බව දැනගෙන සිටිය බව යි.

ප්‍රවීන් : ඇයි එහෙම නම් එයාට ගොඩාක් කරදර ආවේ?

ගුරුතුමී : ඒ බව තමයි මම දැන් විස්තර කරන්න යන්නේ. එයාගේ ගේ දොර, ඉඩකඩම්, දරුවන්, මෙහෙකරුවන්, බැටළුවන්, ඔටුවන් යනාදි සියලු දේ එයාට අහිමි වුණත් මේ සියල්ලට ම වඩා දෙවියන් වහන්සේ ගැන පුදුම විශ්වාසයක් ජෝබ්ට තිබුණා. සියලු දේපළ වස්තුව සාතන් විසින් අහිමි කළත් ජෝබ් දෙවියන් වහන්සේ කෙරෙහි තැබූ ඇදහිල්ල සොලවන්නට සාතන්ට බැරි වුණා.

ගීතිකා : ඒත් ජෝබ් සාතන්ගේ ක්‍රියාවට යටත් වුණේ නැති එක නම්, හරි පුදුමයක් නේ ද?

ගුරුතුමී : ඔව්, ජෝබ් සාතන්ට යටත් වුණේ ම නැහැ. පසුව මුළු ඇඟ පුරා ම ඔහුට දරුණු ලෙස කුෂ්ඨයක් පවා හැදුණා. ඒත් වැරදිලාවත් ඔහු දෙවියන් වහන්සේට දොස් කීවේ නැහැ.

ශෙහාන් : හරි පුදුමයි, මෙච්චර දුක් කරදර ඇති වුණත් සියල්ල අහිමි වුණත් එයාගේ ඇදහිල්ල අඩු වුණේ ම නැති එක නම් හරිම පුදුමයක්!

ගුරුතුමී : ඒ ගැන තමයි අද අපි ඉගෙන ගන්නේ. ජෝබ්ට සාතන් පහර දෙන්න පහර දෙන්න ජෝබ් දෙවියන් වහන්සේට තවත් ළං වෙනවා. පැමිණි සියලු දුක් වේදනා කිසි විටක ඔහු, ඔහුගේ ඇදහිල්ලට බාධාවක් කර ගත්තේ නැහැ.

ප්‍රවීන් : ඒක නම් හරි ම පුදුම ඇදහිල්ලක් නේ ද ?

ගුරුතුමී : ඒ වගේ ම අපි දැන් ජෙරමියා ගැනත් දැන ගනිමු. ප්‍රවීන් පුතා කියවන්න බලන්න ජෙරමියා පොතේ 38 වන පරිච්ඡේදය

**කියවා බලමු.**

**ජෙරමියා 38 පරිච්ඡේදය**

ගුරුතුමා : ශෙහාන් කියන්න බලන්න, දැන් කියවූ බයිබල් කොටස පිළිබඳ පොඩි විස්තරයක්.

ශෙහාන් : මෙය බැබිලෝනියාවේ අධිරාජ්‍යයාගෙන් ජුදා දේශයට තර්ජන තිබුණ කාලයක සිදු වුණ දෙයක්. ජෙරමියා දෙවියන් වහන්සේගේ වචනය ජුදා ජනතාව වෙත ඉදිරිපත් කළා.

ගුරුතුමී : බොහොම හොඳයි. බයිබල් කියවීමට හොඳින් ඇහුම්කන් දී තිබෙනවා.

ගීතිකා : ජෙරමියා ජුදා ජනතාවට දුන් විශේෂ පණිවුඩය මොකක් ද?

ගුරුතුමී : ඔහු අනාවැකියක් කීවා. ජුදා සෙනග බැබිලෝනියට රැගෙන යන බව. ඒ ගැන පැවසූ විට මොකක්ද සිද්ධ වුණේ කියලා, ප්‍රවීන් කියන්න බලන්න.

ප්‍රවීන් : ජුදා අධිපතීන් විසින් ඔහු හිරගෙදර තිබුණු මඩ පිරුණු ළිඳකට දමා දවස් ගණනක් කිසිම කෑමක් නැතිව තැබුවා. පසුව රජතුමා ඔහු ගැන පණිවුඩයක් ලැබුණාට පසු ඔහු ළිඳෙන් ගොඩ ගන්නා ලෙස අණ කළා. ජෙරමියා මරණින් බේරුණා.

ගුරුතුමී : හරියට හරි. ඒක ඇත්ත. අපි මෙයින් ඉගෙන ගන්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කරන්නට සිදුවන විට, අපට දරා ගන්නට බැරි දුක් කරදරවලට මුහුණ දෙන්නට සිදුවන බව. ඒත් අපි දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් යුතුව ස්ථිර ව ජීවත් වන විට දෙවියන්වහන්සේ අපත් සමග ඒ සෑම දුක් අවස්ථාවල දී ම ඉන්න බව පැහැදිලි යි.

## දුක් විඳින සේවකයාණෝ (යෙසායා 53: 12, 42: 1-4)

ජුදෙව් ජනතාව මෙසියස් වහන්සේ එනතුරු බලා සිටියහ. මෙය මීට කලින් පාඩමක අපි අධ්‍යයනය කළෙමු. ඔවුන් මෙසියස් හෙවත් ආලේප ලත් තැනැත්තා සම්බන්ධයෙන් නිතර බලාපොරොත්තු වුණේ රාජකීය හා දේශපාලන භූමිකාවකි. දාවිත් වැනි රජවරුන්ගෙන් ඔවුන් බලාපොරොත්තු වූ විශේෂ ගුණාංගයන් හා හැකියාවන් තිබුණි. එහෙත් යෙසායා දිවැසිවරයා ජනතාවගේ බලාපොරොත්තුවලට හාත්පසින් වෙනස් වූ භූමිකාවක් ගැන කථා කළේ ය.

කීර්තිය හා බලය වෙනුවට යටහත් පහත්කම, ඉවසීම හා දුක් දැරීම යන චරිත ලක්ෂණවලින් යුක්ත කෙනකු ගැන අපට යෙසායා දිවැසිවරයා වරින් වර සිය දිවැසාවලියේ කරුණු දක්වයි. අපගේ ශුද්ධ ලියවිලි පාඨ දෙකේ ම දුක් විඳින සේවකයාණන් ගැන සඳහන් කරුණු අපි සම්පිණ්ඩනය කරමු.

- ❖ එතුමාණෝ දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටී.
- ❖ සැර පරුෂ ගති ලක්ෂණ වෙනුවට මෘදු ලීලාවකින් සැරසී සිටියි. (යෙසායා 42ඃ 2)
- ❖ දුක් පීඩාවට ලක්වූවන් තවත් පීඩාවලට ලක් නො කරයි. (යෙසායා 42ඃ 3)
- ❖ අධෛර්ය නොවන මෙහෙකරු, කලකිරීමට ලක් නොවී, යුක්ති සහගත ලෙස ක්‍රියා කරයි. (යෙසායා 42ඃ 4)
- ❖ සේවකයාණන් අපගේ පාපයේ අශෝබන බව සිය හදවතින් හා මුහුණින් දරන නිසා, සේවකයාණන්ට සිත් ඇදගන්නා රූපයක් නැති බව යෙසායාතුමා සිතුවම් කරයි. (යෙසායා 52ඃ 02)
- ❖ දුක හා වද වේදනා දරයි. (යෙසායා 53ඃ 3)
- ❖ අප වෙනුවෙන් ලද පහරවලින් අපට සුවය ලැබී තිබේ (යෙසායා 53ඃ 5)
- ❖ මරණය, අපගේ පව් කමා කරන පූජා වීමේ මරණයකි. (යෙසායා 53ඃ 10)
- ❖ පව්කරුවන්ගේ පව් දරා ගනිමින් මැදහත්කාරකම් කරයි. (යෙසායා 53ඃ 12)

මෙම සියලු ලක්ෂණවලින් පැහැදිලි වන්නේ මේවා මෙසියස් වහන්සේගේ එනම් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම සම්බන්ධ දිවැසි වාක්‍ය බවයි.



## දුක් විඳින සේවකයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ

යෙසායා පොතෙන් හුවා දක්වන දුක් විඳින සේවකයාණන්, මෙසියස් වහන්සේ පිළිබඳ රූපකයේ සැබෑ ස්වභාවය හෙළිදරව් කරන්නකි. දුක් විඳින සේවකයාණන්ගේ කාර්ය භාරය සම්පූර්ණ කරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බව නව ගිවිසුම අපට සාක්ෂි දරයි.

යෙසායා 5: 41 පදයේ සඳහන් මේ කරුණු මතෙව් 8: 17 පදයේ මෙසේ සඳහන් වී තිබේ. එනම් "උන් වහන්සේ අපගේ දුබලකම් දරාගත් සේක. අපගේ රෝ දුක් බර උසුලාගත් සේකැ යි යෙසායා දිවැසිවරයා විසින් කියන ලද කීම ඉටුවන පිණිස යි"යනුවෙනි. මෙම පදයෙන් විස්තර වන දුක් විඳින සේවකයාණන් වන ජේසුස් වහන්සේ සැබෑ ලෙසින් ම දුක් විඳ කුරුසිපත් වී මරණයට නියම වූ බව ශුභාරංචි පොත් හෙළි කරන අතර, එය දේව කැමැත්ත අනුව සිදු වූවක් ම විය. එම දුක් විඳීමේ ප්‍රතිඵලය වූයේ උන්වහන්සේගේ විජයග්‍රාහී උත්ථානය යි.

ඉන් පැහැදිලි වන්නේ ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින සේවකයාණන් ලෙස දේව කැමැත්තට භාර වීමෙන් තමන්ට වන හානිය ගැන නොසලකා පසුබට නොවී, ධෛර්යයෙන් යුතුව මුළු ලෝකය උදෙසා ජීවිතය පිදූ බව යි.

## දුක් විඳින සේවකයාණන් හා අපි

දුක් විඳින සේවකයාණන්ගේ කාර්ය භාරය අපට දෙයාකාරයකින් අදාළ වේ.

- උන්වහන්සේගේ දුක් විඳීම කරණ කොටගෙන අපට මිදීම හා සහනය ලැබෙන නිසා අපි උන්වහන්සේ හා ඇදහිල්ලෙන් බැඳී ක්‍රියා කළ යුතු ය. එවිට උන්වහන්සේගේ දුක් විඳීමේ පූර්ණ ආනිසංසය අපට ලැබේ.

- මමත්වය නසා ගනිමින් පරාර්ථකාමී සේවකත්වයකට ඇතුළු වීම අවශ්‍ය ය. ඒ තුළ කුරුසි මාර්ගය අනුගමනය කිරීමෙන් අපි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත ආදර්ශය අනුව ක්‍රියා කරමු. ලෝකයෙන් පැමිණෙන විවිධ පීඩාවන්, අපවාද, දුක් කරදර සියල්ලට ධෛර්යයෙන් හා ඇදහිල්ලෙන් මුහුණ දෙමින් ගමන් කරමු. දුක් විඳීම හා පූජාවීම අපගේ සේවයේ අනිවාර්ය අංගයකි. අප, දේව බලය තුළ ශක්තිමත් කිතුනුවන් බවට පත් වන්නේ එවිට යි. එසේ අපගේ ජීවිතයට පැමිණෙන දුක් පීඩා විඳ දරා ගනිමින් දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමට අපි අදිටන් කර ගනිමු.

### ක්‍රියාකාරකම්

01. යෙසායාතුමාගේ පොතේ 42:1-4 දක්වා ඇති කොටසේ දුක් විඳින සේවකයාණන්ගේ ලක්ෂණ හතරක් ලියන්න

02. පහත සඳහන් පුද්ගලයින් පිළිබඳව කරුණු සොයා බලා ඔවුන්ගේ ජීවිතවලින් අදාළ කරගත හැකි යහපත් ගුණාංග දෙක බැගින් ලියන්න.



නෙල්සන් මැන්ඩෙලා මහතා



මයිකල් රුද්‍රිගු පියතුමා